

**පැවරුම 6** **ශ්‍රී ලංකාවේ භූ දර්ශනය**

ඕනෑම ප්‍රදේශයක භූ දර්ශනය භෞතික භූ දර්ශනය හා මානුෂ භූ දර්ශනය යනුවෙන් ආකාර දෙකක් ඔස්සේ හඳුනාගත හැකි අතර මෙම භූ දර්ශන අතර සබඳතාවය මගින් ප්‍රදේශයක සමස්ථ භූ දර්ශනය නිර්මාණය වේ.

1.පහත දැක්වෙන සිතියම් දෙක හොඳින් නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.








I. A හා B සිතියම් වලින් ව්‍යාප්තිය පෙන්නුම් කරන මෝසම් වර්ෂා දෙවර්ගය නම් කරන්න.

II. A හා B මෝසම් වර්ෂා ක්‍රියාත්මක වන කාල වකවානු නම් කරන්න.

III. A හා B මෝසම්වල වර්ෂාපතන ව්‍යාප්ති රටාවේ කැපී පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න.

2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප යාබද සිතියමෙන් දැක්වේ.




I. 1 සිට 5 දක්වා ඇති දේශගුණික කලාප නම් කරන්න.

II. අංක 1 දේශගුණික කලාපයේ කැපී පෙනෙන ලක්ෂණ නම් කරන්න.

III. අංක 3 හා 4 දේශගුණික කලාප වෙන් කිරීමේදී පදනම් කරගන්නේ කුමක්ද?

IV. පෙළ පොතේ 42 පිටුවේ දැක්වෙන ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා කලාප දැක්වෙන සිතියම නිරීක්ෂණය කර අංක 5 දේශගුණික කලාපය ආශ්‍රිතව දක්නට ලැබෙන වෘක්ෂලතා වර්ගය නම් කරන්න.

V. ඉහත IV කොටසේ හඳුනාගත් වෘක්ෂලතාවර්ගයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?

*සැකසුම - ඉසුරු බණ්ඩාර, නිවිතිගල අධ්‍යපන කලාපය, දොළොස්වලකන්ද විද්‍යාලය*